පඩි පාලක සභා මගින් පාලනය වන පෞද්ගලික අංශයේ සේවකයින්ගේ මූල්‍ය වැටුප් කම්කරු දෙපාර්තමේන්තුවේ වැටුප් ප්‍රමාණ දර්ශක මගින් පෙන්නුම් කරන පරිදි 1978 දී ඉහළ වර්ධන අනුපාතයක් පෙන්නුම් කරයි. කෘෂිකාර්මික අංශයේ සේවකයින්ගේ වැටුප් සියයට 45 කින් ඉහළ ගිය අතර කර්මාන්ත හා වාණිජ අංශයේ සේවකයින්ගේ වැටුප් සියයට 24 කින් ඉහළ ගියේය. 1977 අදල වැටුප් වැඩිවීම පිළිවෙලින් සියයට 25 කින් හා සියයට 8 කින් විය. උද්ධමනයට සඳහා ගැලපූ විට මූර්ත වැටුප් මෙම අංශයේ වැඩිවූ බව පෙනෙන්නට ඇත. මීට හේතුවූ සාධක වූයේ 1977 දෙසැම්බර් මස රජයේ සේවකයින්ට දෙන ලද වැටුප් වැඩිවීම පෞද්ගලික අංශයේ සේවකයින්ටද ව්‍යාප්ත කිරිම, කොළඹ පාරිභෝගිකයින්ගේ මිල දර්ශකයේ ඉහළ යාම අනුව ජීවනාධාර වැඩිකිරීම සහ තේ හා රබර් වගාවන් හි මිල ඉහල යාමට අනුකූලව එම අංශවල සේවකයින්ට වැටුප් අතිරේකයන් දීම යන ආදියයි.

කෙසේ වුවද දැනට ඇති වැටුප් දර්ශක අනුව පෙන්නුම් කරන්නේ අදල අංශවල සේවක යින්ගේ අවම වැටුප් පමණක් වන අතර, අතිකාල දීමනා, වැටුප් වර්ධන, පාරිතෝෂික දීමනා සහ වෙනත් දිරිගැන්වීමේ දීමනා වැනි අතිරේක ගෙවීම් මෙයට ඇතුළත් නොවන බව සඳහන් කළ යුතුය,

අඩුවන මූර්ත වැටුප් නිසා රජයේ මෙන්ම පෞද්ගලික අංශයේ සේවකයින් සාමාන්‍ය වැඩ කරන වේලාවන් ඉක්මවා අනවශ්‍ය අතිකාල වැඩ කිරීමෙන් හා පෞද්ගලික කෙටිකාලීන රැකියාවල්වල නිරතවීමෙන් තමන්ගේ නාමික අදායම් වලට අතිරේක ආදායමක් ලබාගැනීමට නැඹුරුවී ඇති බව පෙනේ. සේවා ස්ථානවල අධික ලෙස නොපැමිණීමේ සංඛ්‍යාව මෙයට සාක්ෂියකි. උද්ධමනය මගින් මූල්‍ය ආදායමේ මූර්ත අගය අඩුවී යාමට ඉඩහැර ඇති තත්ත්වයක් තුළදී මෙවැනි දේ නොවැළැක්විය හැක්කකි. වැටුප් වැඩි කිරීමෙන් මෙම තත්ත්වය නැති කිරීමට උත්සාහ දරනවාට වඩා නිෂ්පාදනයට වැටුප් සම්බන්ධ කිරීමෙන් හා උද්ධමනයට සරිලන සාධාරණ වන්දි ගෙවීම මෙම ප්‍රශ්ණයට වඩා ඵලදයී ක්‍රියා මාර්ගයක් වනු ඇත.

## සේවා නියුක්තිය

පසුගිය වාර්ෂික වාර්තාවල පෙන්නුම් කරන ලද පරිදි විශ්වාසදයක හා අඛණ්ඩ දත්ත නොමැතිකම ශ්‍රී ලංකාවේ සේවා නියුක්තිය හා සේවා වියුක්තිය පිළිබඳ උපනති නිරීක්ෂණය කිරීමට ඇති මූලික බාධාවකි. එමනිසා මුළු ශ්‍රම බලකාය, සේවා නියුක්ති හා සේවා වියුක්ති වැනි විචල්‍යයන් අක්‍රමවත් කාල පරතරයන් තුල ජනලේඛන හා නියැදි සමීක්ෂණ මගින් ලබාගන්නා ලද දත්ත මත තක්සේරු කිරීමට සිදුවී ඇත. මෙම විචල්‍යයන් සඳහා ලබාගත හැකි අළුත්ම පූර්ණ දත්ත තිබෙනුයේ 1971 සහ 1973 යන වර්ෂ සඳහාය.

1971 ජනලේඛනයට අනුව මුළු ජන සංඛ්‍යාවෙන් සියයට 35 ක් වූ ලක්ෂ 45 ක ශ්‍රම බල කායක් විය. 1973 දී මහබැංකු මූල්‍ය හා පාරිභෝජන සමීක්ෂණයට අනුව මෙම සංඛ්‍යා මීට මඳක් වැඩිවිය. ජන සංඛ්‍යාවේ වයස් ව්‍යුහයට හා ක්‍රියාකාරී වයස් අනුපාතයන් අනුව 1978 දී මුළු ශ්‍රම බලකාය 56 ලක්ෂය දක්වා වැඩි වී ඇති බව පෙන්නුම් කරයි. එය 1978 සඳහා තක්සේරු කරන ලද ජන සංඛ්‍යාවෙන් සියයට 39 කි.

ජනලේඛන දත්තවලට අනුව 1971 දී සේවා වියුක්ති සංඛ්‍යාව 8,39,246 ක් වූ බව හෙළි විය. 1973 මූල්‍ය පාරිභෝගික සමීක්ෂණයට අනුව මෙම සංඛ්‍යාව දශ ලක්ෂයක් විය. 1978 වර්ෂය අවසානයේ දී මෙම සංඛ්‍යාව 9 ලක්ෂයක් වූ බව 1978 ඔක්තෝබර් මස ආරම්භ කරන ලද මහබැංකු පාරිභෝගික මූල්‍ය සහ සමාජ ආර්ථික සමීක්ෂණයට අනුව ලබාගත් තාවකාලික දත්ත මගින් අනාවරණය වේ. මේ අනුව 1973 සිට සේවා වියුක්ති සංඛ්‍යාවේ අඩුවක් පෙන් නුම් කරයි. කෙසේ වෙනත් මෙම දත්ත සේවා වියුක්ති මට්ටම හා උපනතිවල දර්ශකයක් ලෙස ඉතා සුපරීක්ෂාකාරීව භාවිත කළයුතු වන්නේ මෙම දත්ත ලබාගන්නා ලද්දේ සමීක් ෂණයේ මුල් වටයේ පළමු අදියරෙන් පමණක් බැවිනි.

රාජ්‍ය අංශයේ සේවා නියුක්තිය පිළිබඳ ශ්‍රී ලංකා මහ බැංකු වාර්ෂික සමීක්ෂණයට අනුව 1978 දී රජයේ දෙපාර්තමේන්තුවල සේවා නියුක්තියෙහි විශාල වැඩිවීමක් පෙන්නුම් කරයි. එනම් රාජ්‍ය දෙපාර්තමේන්තුවල සේවා නියුක්ති සංඛ්‍යාව 23,438 කින් හෙවත් සියයට 5.5 කින් වැඩිවිය. අළුත් රැකීරක්ෂා ඇතිවූ ප්‍රධාන මාර්ග වනුයේ ගුරු වෘත්තිය (6%), සුළු සේවක අංශ (6%) සහ සහායක සේවක (5%) යන අංශයන්ය.

LIBRARY SRI LANKA

අර්ධ රාජ්‍ය ආයතනයන් හි (එනම් ව්‍යවස්ථාපිත මණ්ඩල හා රාජ්‍ය සංස්ථා) සේවක සංඛ්‍යාව 35,439 කින් නැතහොත් සියයට 6 කින් වැඩිවිය. මෙයින් සියයට 73 ක් සුළු සේවක ශ්‍රේණි සඳහා වූ අතර සියයට 25 ක් සහායක ශ්‍රේණිවල විය.

ප්‍රමාණවත් දත්ත නොමැති කමින් අර්ථසාධක අරමුදලේ ක්‍රියාකාරි ගිණුම් සංඛ්‍යාව ආයතනගත පෞද්ගලික අංශයේ සේවා නියුක්තියේ වාර්ෂික වෙනස්වීම මැනීමට ප්‍රයෝජනයට ගන්නා ලදි. 1977 දී ක්‍රියාකාරි ගිණුම් සංඛ්‍යාව 1976 දී පෙන්නුම්කල 34,403 ක පහත වැටීමට ප්‍රතිවිරුද්ධ වශයෙන් 73,309 කින් වැඩිවිය. මෙයට වැවිලි අංශයේ 48,676 (20%) ක් ද, නිෂ්පාදන අංශයේ 13,132 (9%) ක් ද සහ සේවා අංශයේ 6,907 (10%) ක වර්ධනයක් ද ඇතුලත් විය. 1978 දී ගිණුම් සංඛ්‍යාව 77,292 කින් වැඩිවූ අතර එය 1977 ට වඩා සියයට 9 ක වැඩිවීමකි. අරමුදලට දයක වන අර්ධ රාජ්‍ය ආයතනයන් හි ඇති වූ අළුත් රැකියා අත්හල විට සංවිධානාත්මක පෞද්ගලික අංශයේ ඇතිවූ අළුත් රැකියා සංඛ්‍යාව 1978 දී 43,369 ක් වියහැකි බව තක්සේරු කළ හැකිය. 1977 දී මෙම සංඛ්‍යාව 43,015 ක් විය.

ඉහත දත්ත අනුව රජයේ දෙපාර්තමේන්තු, අර්ධ රාජ්‍ය ආයතන හා සංවිධානාත්මක පෞද්ගලික අංශයේ රැකීරක්ෂා සම්පාදනය 1977 දී 40,000 ක් වූ අතර, එය 1978 දී 1,02,000 ක් පමණ වූ බව පෙනේ. කෙසේ වෙතත් මෙම සංඛ්‍යාවට මෙම අංශවලින් විශ්‍රාම ගිය හා වෙනත් හේතුන් මත රැකියා හැර ගිය අය වෙනුවෙන් පත්කරන ලද අය ඇතුළත් නොවේ. එසේම දේශීය කෘෂිකර්ම අංශයෙන් හා ආයතනික නොවූ පෞද්ගලික අංශයේ රැකීරක්ෂා ද ඇතුළත් නොවේ. එම අංශ දෙකේ රැකියා ඇස්තමේන්තුකොට නොමැත. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල මගින් මෑතකදී පවත්වන ලද සමීක්ෂණයකට අනුව 1978 වර්ෂ අවසානයේ දී ශ්‍රී ලාංකිකයන් 20,000 ක් පමණ මැද පෙරදිග රැකියාවල යෙදී සිටි බව හෙළිවී ඇත. පුහුණු මෙන්ම උගත් අයගේ මෙම සංක්‍රමණයෙන් පැන නැගිය හැකි ප්‍රශ්ණ පසුගිය වාර්ෂික වාර්තාවෙන් ද පෙන්වා දෙන ලදී. රාජ්‍ය අංශය මගින් නව තාක්ෂණිකයන් පුහුණු කිරීමට දරණ ලද උත්සාහයන් ප්‍රමාණවත් නොවන බව පෙනේ. ප්‍රමාණවත් දිරිදීම් සහිතව පෞද්ගලික අංශයට මෙය වඩා සාර්ථකව කළහැකි බව පෙනේ.

සේවා වියුක්ති සමහර කොටස්වලට රුපියල් 50/- ක මාසික දීමනාවක් දීමට 1978 අයවැය කථාවෙන් ප්‍රකාශිත අදයම් ආධාරදීමේ වැඩ පිළිවෙල මෙම වසරේ අවසන් භාගයේ දී ක්‍රියාත්මක විය. මෙම ආධාර ක්‍රමය යටතේ ආධාර ලැබූවන්ගේ සංඛ්‍යාව වර්ෂ අවසානයේ දී 3,72,684 ක් වූ අතර, මේ සඳහා රුපියල් දශලක්ෂ 114 ක මුදලක් වැය විය. පසුගිය දශක කීපය තුල රැකියා පුරප්පාඩු පිරවීම සඳහා පැවැති රැකීරක්ෂා කාර්යාල වෙනුවට 1978 වර්ෂයේ දී රැකීරක්ෂා බැංකු ක්‍රමයක් ක්‍රියාත්මක කරන ලදී. මෙම නව වැඩ පිළිවෙලේ ප්‍රධාන පරමාර්ථය වන්නේ ආරක්ෂක සේවාවන්, රාජ්‍ය අංශයේ හා පළාත් පාලන අංශයේ මාණ්ඩලික නොවන ශ්‍රේණි සඳහා පුරප්පාඩු පිරවීම සම්බන්ධීකරණය කිරීමයි.

## විදේශීය වෙළෙඳාම

ශ්‍රී ලංකාවේ වෙළෙඳ තුලනය හෙවත් ශේෂය (රේගු සංඛ්‍යා අනුව) 1978 දී රුපියල් දශලක්ෂ 1,457 (වි. හැ. අ. දශලක්ෂ 98) හිඟයක් දක්වූයේ අවුරුදු දෙකක පැවති අතිරික්ත තත්ත්වයකින් පසුවය. කිසියම් කාලපමාවකින් පසු ලේඛනගත වන සමහර රජයේ ආයතන වල ආනයන සහ අපනයන සඳහා රේගු සංඛ්‍යා ගැලපූවිට වෙළෙඳ තුලනය රුපියල් දශලක්ෂ 2,173 දක්වා වැඩිවෙයි.